සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## වර්ෂ අවසාන ඇගයීම - 2012

## 11 - ශ්‍රේණිය

## සිංහල භාෂාව හා සාහිත්‍යය

## පිළිතුරු පත්‍රය

### I පත්‍රය

| | | | |
|---|---|---|---|
| (1) - 2 | (11) - 3 | (21) - 3 | (31) - 4 |
| (2) - 3 | (12) - 2 | (22) - 4 | (32) - 1 |
| (3) - 2 | (13) - 4 | (23) - 4 | (33) - 2 |
| (4) - 1 | (14) - 2 | (24) - 1 | (34) - 1 |
| (5) - 4 | (15) - 2 | (25) - 2 | (35) - 3 |
| (6) - 3 | (16) - 1 | (26) - 3 | (36) - 3 |
| (7) - 1 | (17) - 2 | (27) - 1 | (37) - 4 |
| (8) - 2 | (18) - 4 | (28) - 2 | (38) - 2 |
| (9) - 4 | (19) - 3 | (29) - 2 | (39) - 4 |
| (10) - 1 | (20) - 1 | (30) - 1 | (40) - 1 |

### II පත්‍රය

1. (i) (අ) ඕෂ්ඨජ අක්‍ෂර (ආ) දන්තජ අක්ෂර
   (ii) (අ) "කිරනවා" යන අර්ථයෙන් ලියා ඇති නිවැරදි වාක්‍ය
   (ආ) "රශ්මිය" යන අර්ථයෙන් ලියා ඇති නිවැරදි වාක්‍ය
   (iii) (අ) ඔව්හු (ආ) ඔබ
   (iv) (අ) වපුළේ ය. (ආ) විචාළේ ය.
   (v) (අ) පෞ (ආ) ෛත
   (vi) (අ) බලා (ආ) බලවයි
   (vii) (අ) සමූහාර්ථවාචී පද (ආ) නිත්‍ය බහුවචන පද
   (viii) (අ) හෙළ කලා කෙත අස්වැද්දූ කලාකරුවෝ සාහිත්‍ය ලෝකයේ ගෞරවයට පාත්‍ර වෙති.
   (ආ) මමත්, රශ්මිකත් ගමන්මලු වාහනයට පැටවීමු. (නිවැරදි වාක්‍යයකි.)
   (ix) (අ) ගඳ කිළි (ආ) සක්විති
   (x) (අ) අගුව (ආ) බිම් ඇඳිරි වැටෙන වෙලාව

2. i. සාරවත් භාවය හා මාතෘකාව - ලකුණු 08
   ii. සංවිධානාත්මක බව නිර්මාණශීලීත්වය හා ස්වීයත්වය - ලකුණු 12
   iii. ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදීම - ලකුණු 05

3. අපේක්ෂිත ප්‍රධාන අදහස්
   i. අනුභූතිවාදයට අනුව සියලු ඥානයන් අනුභූතිය ඇසුරෙන් ගොඩ නැගේ.
   ii. හිස්ව උපදින මනස ඥානයෙන් පිරෙනුයේ ලොවින් පංචේන්ද්‍රියන් වෙත ලැබෙන අනුභූතීන් හේතුවෙනි.
   iii. බුද්ධිවාදීන්ගේ සහජ සංකල්පවාදය ඔව්හු බැහැර කරති.
   iv. ඉන්ද්‍රිය අනුභූතිය විශ්වාසය මත පදනම් ව ඇත.
   v. "ප්‍රත්‍යක්ෂය" පිළිබඳ විශ්වාස කරන ලොක් හා බර්ක්ලේ දේව හා ආත්ම සංකල්ප පිළිගැනීම ද ගැටලුවකි.

| | | | |
|---|---|---|---|
| අන්තර්ගතය | : | ප්‍රධාන අදහස් සඳහා | - ලකුණු 06 |
| වචන ගණන | : | වචන 50 - 55 අතර | - ලකුණු 02 |
| ශිල්පීය දක්ෂතා | : | වියරණ අත්අකුරු විරාමලක්ෂණ ඡේදයක් සේ ලියා තිබීම | - ලකුණු 02 |
| | | | 10 |

4. i. පළමු පරාක්‍රමබාහු රජුගේ ගල්විහාර කතිකාවත.
ii. පොළොන්නරු යුගයේ මධ්‍ය භාගය.
iii. සිංහල භාෂාව හා රචනා රීතිය.
iv. • සිංහල ගද්‍ය රීතියේ විශේෂ වෙනසක්. • සිංහල වාග් කෝෂයේ පෘථුලභාවයක්.
v. • වචනවල දක්ෂතාව • පුළුල් බව, පළල් බව

5. i. පුවත්පත් වාර්තාව :- හා තීරු ලිපිය
ආකෘතිය - ලකුණු 05
• ආකර්ෂණීය ශීර්ෂය - ලකුණු 02
• නිර්මාණශීලි බව - ලකුණු 02
• වාර්තාකරු - ලකුණු 01
අන්තර්ගතය - ලකුණු 07
• ව්‍යුහයේ අඩංගු සෑම කරුණක්ම අඩංගු විය යුතුය.
ශිල්පීය දක්ෂතා - ලකුණු 03
• අක්ෂර වින්‍යාසය, අත් අකුරු, පද බෙදීම, වියරණ, විරාම ලකුණු, ඡේද බෙදීම ආදිය සලකා ලකුණු දෙ

## III පත්‍රය

1. i. (අ) සෝමා (ආ) පාට පෙට්ටි වර්ගයක්
ii. (අ) බිම්බිසාර රජතුමා තමන්ට වැලඳීඇති රෝගය ජීවක වෛද්‍යවරයාට පෙන්වූ අවස්ථාව / බිම්බිසාර ජීවක වෛද්‍යවරයාව ඉහළ මහලට රැගෙන ගොස් තම රෝගය පෙන්වූ අවස්ථාව
(ආ) නියහස්සෙහි තුබූ ඖෂධය මැත් කොට පිළිකය මතුයෙහි ආලේප කිරීම
iii. (අ) නොවඳිම් සිදුහත් (ආ) සතුට නැමැති රජකම ලබා
iv. (අ) උපමාව :- නිම් වොටුන්නේ ඔබන මැණික (ආ) උපමේය :- මේ බත් තලිය
v. (අ) මොනිකා රුවන්පතිරණ කිවිඳියගේ (ආ) අප දෙන්නා සහ තවත් කීප දෙනෙක්, තහනම් දේශය අංගුලිමාලගේ සිහිනය, ඔබ යෙහෙළිය ඇය ගැහැණි ආදී වශයෙන්
vi. (අ) බාබුජී / බාබු සහිබ් (ආ) රාහුල් ජු පොත් මිටිය සමඟ අතුරුදහන්වීම.
vii. (අ) උත්ප්‍රේක්ෂාලංකාරය (ආ) කොළඹ යුගය /කොළඹ යුගයේ
viii. (අ) ගෝනහේන (ආ) ලව්තෝරිස්
ix. (අ) ෂඩ්භාෂා පරමේශ්වර (ආ) පද්‍ය - සැළලිහිණි සංදේශය, පරෙවි සංදේශය, කාව්‍යශේඛරය
x. (අ) සුඛාන්ත (ආ) දුඃඛාන්ත / දුක්ඛාන්ත (ලකුණු 2 × 10 = 2

2. i. i. ලේලියගෙන් / පුතාගේ බිරිඳගෙන්
ii. හරක් / මී හරක්
පුතාගෙන් භාර දහසක් හා ලේලියගෙන් භාර දහසක් හා මේ ආකාරයට දාසය දහසක් නිල්කහවණු ත රත්තරන් දී අශ්වයින් යෙදූ රථයක්, මෙහෙකරුවන් හා මෙහෙකාරියන්,. හරක් මී හරක් ආදී වශ බොහෝ වස්තු දුන්හ.

ii. i. හිතවත් දන්නා හඳුනන / හොඳින් හිතවත් ව ඇසුරු කර පළපුරුදු ඇති
ii. සිත් පිනවන / සිත් සනහන මේ සුන්දර කාන්තාව
යට ගිය දවස සිට හොඳින් හිතවත් ව ඇසුරු කර පළ පුරුදු ඇති ඔබ දුන් මේ ලෙස පවසන්නේ නම්, දුරටත් සැරෙන් කතා කරමින් කලකෝලාහල කර ගන්නේ නැතිව, හොඳයි, මේ සුන්දර කාන්තාව බිරි ලෙසට සරණ පාවා ගන්නෙමි.

iii. i. ඒ අකීකරු වූ
ii. දිගා වුණා නේද - වැතිරුණා නේද
පෙර අකීකරු වූ නිසා ම ඥානවන්තයින්ගේ බස් නොඅසා සියුම් මුවහත් කඩුවකින් කපා දෙකට ලෙ කරනු ලැබ මග වැතිරුණා නේද? ඔබ එක තැනැත්තෙක් නිසා, දහසක් මිනිස්සු මරණයට පත් වූ නේද'යි පවසා අතීත කථාව දක්වා වදාළ සේක.

iv. i. උස් වූ පර්වතයෙන් පර්වතය / කන්දෙන් කන්ද
ii. ප්‍රාණ වායුව
උසට උසේ පිහිටි කන්දෙන් කන්දට බසිමින්, නැවත අවශ්‍ය වූ විට ඒවායේ ඉහළට නගිමින්, මේ වනාන්තර දී මීට පෙර අවදියේ දී, සතුට තව තව වැඩි කර ගනිමින් ඇවිද හැසිරුණ මට, මෙබඳු වෙන්වීමේ දු ඉවසා දරා ගන්නට සිදු වූ විට, උතුම් සැමියාණෙනි, මගේ පණ තව දුරටත් රැකී තියේවිද?
(ලකුණු 5 × 4 =

3. "අපටත් දවසක ඉර පායාදෝ" කෙටි කතාවේ සිරියාවතී විසින් අඳින ලද චිත්‍රය තුළින් ඇයගේ

(අ) පවුල් පරිසරය පිළිබඳ තොරතුරු (ආ) නිර්මාණ කුසලතාව

ප්‍රදර්ශනය කරයි. එක කොටසකට උදාහරණ දෙක බැගින් දෙමින් කරුණු පැහැදිලි කරන්න.

උත්තරය

(අ) පවුල් පරිසරය පිළිබඳ තොරතුරු

i. චිත්‍රය සඳහා තමන්ගේ ජීවිතයට සමීප මාතෘකාවක් තෝරා ගැනීම.

ii. චිත්‍රයෙන් නිරූපිත මවගේ හැඩරුව විස්තර කිරීම තුළින් ආර්ථික තත්ත්වය හෙළිදරව් වීම.

iii. සිරියාවතී විසින් තම චිත්‍රය අගය කිරීම. ආදී අවස්ථාවන්ගෙන් උදාහරණ දෙකක් මගින් පැහැදිලි කිරීම අවශ්‍යය. වෙනත් පිළිගත හැකි උදාහරණ දී ඇත්නම් ලකුණු පිරිනමන්න.

(ආ) නිර්මාණ කුසලතාව

i. චිත්‍රයට පාට යොදා ගැනීම ii. ඇගේ චිත්‍රයට වැඩිම ලකුණු ලැබීම.

iii. පද්මා මිස් චිත්‍රය අගය කරමින් ඒ පිළිබඳ විස්තර කිරීම.

iv. අම්මාගේ සැබෑ ස්වරූපය ම චිත්‍රයට නඟා තිබීම ආදී ගැළපෙන කරුණුවලින් දෙකක් උදාහරණ දෙමින් විස්තර කර තිබීම අවශ්‍යය.

නැතහොත්

දයාසේන ගුණසිංහ මහතා විසින් රචිත 'කිසාගෝතමියක නොවේ' පැදි කියවන සහෘදයා වඩාත් කම්පනයට පත් කිරීමෙහිලා

(අ) මවගේ අසරණභාවය

(ආ) හරසුන් මිනිසුන්ගේ ජීවන පැවැත්ම හේතුවෙයි. උදාහරණ දෙක බැගින් දෙමින් විස්තර කරන්න.

(අ) මවකගේ අසරණභාවය

පහත සඳහන් උදාහරණ දෙකක් ඉදිරිපත් කරමින් විස්තර කර තිබීම අවශ්‍යයි. වෙනත් ගැළපෙන උදාහරණ ද පිළිගන්න.

i. රථයෙහි මැදියම ගෙවන මොහොතෙහි ii. විදි සරනා මවක දුටුවෙමි.

iii. කිසාගෝතමියක ලෙසින් ඇය

(ආ) හරසුන් මිනිසුන්ගේ ජීවන පැවැත්ම

i. නැගෙන සැණකෙළි හඬින් සිව් දෙස ............. ii. මංසලෙන් සල නැඟූ තොරණින් ...............

i. රථයෙහි මැදියම ගෙවන මොහොතෙහි ............. iv. උවසු උවැසියො ගැයූ බැති ගී ......................

ඉහත සඳහන් කවිවලින් දෙකක් උදාහරණ ලෙස දක්වා විස්තර කිරීම අවශ්‍යය. (ලකුණු 15)

4. උත්තරෝලිය වස්තුවෙන් එවක ජන ජීවිතයේ පැවති

(අ) ආර්ථික තත්ත්වය පිළිබඳවත් (ආ) සමාජ තොරතුරුත්

හෙළිදරව් කරයි. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විස්තර කරන්න.

(අ) ආර්ථික තත්ත්වය පිළිබඳ ව

i. ජීවන වෘත්තීන් ii. ආහාරයට ගන්නා දේ iii. ඇඳුම් පැළඳුම් පිළිබඳ දක්වෙන කරුණු

(ආ) සමාජ තොරතුරු

i. පහත් ම ස්ථරයේ සිට ඉහළ ම ස්තරය දක්වා මිනිසුන් මේ ගමේ වාසය කිරීම.

ii. නිධන් හා දෙවි දේවතාවුන් පිළිබඳ විශ්වාස

iii. භික්ෂූන් වහන්සේ පිණ්ඩපාතයේ වැඩම කළ බව, රහතන් වහන්සේලා ජීවත් වූ බව.

iv. දරුවන්ට අකුරු ඉගැන්වීම සඳහා නැකත් යොදා ගැනීම සිදුකරන බව

v. ශිල්ප වයස අවුරුදු පහෙන් ආරම්භ කිරීම

vi. රාජ නීතිය ක්‍රියාත්මක වූ ආකාරය. (යන කරුණුවලින් දෙකක් උදාහරණ සමග විස්තර කිරීම අවශ්‍යය.)

නැතහොත්

සිදුහත් බෝසතුන් මහාමායා දේවිය කුස පිළිසිඳ ගැනීම ජනකවියා,

(අ) ආශ්චර්යය හා (ආ) භක්තිය දනවන

අයුරින් නිර්මාණය කර ඇත. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් මේ මතය විමසන්න.

උත්තරය :

(අ) ආශ්චර්යය

"දණක් පමණ මල් අතුරපු දිව යහනේ"

"රන් යහනේ සැතපෙන කල දුටු සිනේ"

"මහසෙන් රැස් ව කුඩ කොඩි ගෙනවට කරට"

"රිදී යහන සැතපෙන කල බිසවුන්ට"

"මහමෙර මුදුනෙ ආසයක වැඩ හිඳිනේ..."

යන කව්වලින් දෙකක් උදාහරණ ලෙස ගෙන පැහැදිලි කිරීම අවශ්‍යය. වෙනත් ගැළපෙන උදාහරණ ලකුණු පිරිනමන්න.

(ආ) භක්තිය දනවන

සුදු සක ලෙසිට ඇත් පැටියෙක් විත් යහනේ ........................

නේරංජනේ ගංගාවේ සුදු වැල්ලේ ........................

දෙනෝදහක් අඟනෝ මට මල් නෙළුවා

පිරි දෙතන් කිරි එරිලා කරඩුවට

ආදී කව්වලින් දෙකක් උදාහරණ ලෙස දක්වමින් විස්තර කිරීම අවශ්‍යය. වෙනත් ගැළපෙන උ පිළිගන්න.

5. කිසියම් අවස්ථාවක් සජීවී ලෙස පද්‍යයෙන් නිරූපණයෙහි ලා තොටගමුවේ ශ්‍රී රාහුල මාහිමියන් දක් වූ "සිදු වූ සෙයින් අදහස" පද්‍ය පන්තිය ඇසුරෙන් උදාහරණ තුනක් දක්වමින් පැහැදිලි කරන්න.

උත්තරය : ඇවිදින් දද මහලු ........................

තොලදත් ඒ දහස ........................

වතින් සොමි සඳ වූ ........................

කිවූ දන එ දවස ........................

අත් කවුතුක බැඳා ........................

යත කව්වලින් තුනක් උදාහරණ ලෙස දක්වමින් විස්තර කිරීම අවශ්‍යය. වෙනත් ගැළපෙන උදාහරණ ද පි

6. "පියසේන ඇසූ ප්‍රශ්නයක්" කවි පෙළ සඳහා කිවිඳිය ජනවහරෙන් පෝෂණය වූ බස් වහරක් යොදා ගෙන සාර්ථකත්වයට හේතු වී ඇත.
උදාහරණ තුනක් දක්වමින් මේ කියමන පැහැදිලි කරන්න.
ගමේ පාසලේ හොඳින් දස්කම් පෑ නිසා බෙබිත් සමග නව පාසලට යන්නට වරම් ලැබීමෙන් පියසේන දුටි වන අයුරු.

i. හතේ අටේ චක්කරයෙන් ගණන් හදා සමත් වෙලා
ii. බෙබිගෙ අත අල්ලාගෙන උදේට පාසල් යනවා
iii. බෙබිගෙ පන්තිය අයිනේ ගල් බැම්මේ වාඩි වෙන්නෙ

යනාදි වශයෙන් ජනවහර දක්වෙන පද්‍ය වලින් තුනක් උදාහරණ ලෙස දක්වා විස්තර කිරීම අවශ්‍ය ගැළපෙන උදාහරණ ද පිළිගන්න.

(

7. ජාතක කතාකරුවා විවිධ පුද්ගල චරිතවල ස්වභාවය හා ඒ අනුව ඇතිවන ප්‍රතිඵල විභාග කිරීමට සාර්ථක දරයි. වේදබ්භ ජාතකයෙන් උදාහරණ තුනක් දක්වමින් මේ අදහස විමසීමට ලක් කරන්න.
වේදබ්භ බමුණාගේ චරිතය (නොකීකරුකමෙන් ඇති වූ ප්‍රතිවිපාක)
බෝසත් සිසුවාගේ චරිතය (දුරදක්නා නුවණින් ලබාගත් වාසි)
සොරු කණ්ඩායම්වල තන්හාව අධිකබව ආදී චරිත ස්වභාවය මතු කෙරෙන අවස්ථා උපුටන මගින් ඉදිරි අවශ්‍යය.

(